සැලකිය යුතුයි: මෙම අත් පත්‍රිකාව විෂය පිළිබඳව පරිපූර්ණ හැඳින්වීමක් නොවේ.පාඨමාලාවට අදාළ මාතෘකාවන්හි ප්‍රධාන කරුණු පිළිබඳව උපාධි අපේක්ෂකයන්ට මඟපෙන්වන්නක් පමණක් වේ.

## හැඳින්වීම :

ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයට අදාළ දේශපාලන විෂයෙහි දෙවන කොටස වන්නේ ක්‍රි.ව.1832 න් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය හා දේශපාලනය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමයි.එහිදි පහත සඳහන් මාතෘකා යටතේ දේශනය සංවිධානය කරනු ලැබේ.

## 01. 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ලෙසින් අප සළකනුයේ 1972 මැයි 22 වනදා ජාතික රාජ්‍ය සභාව විසින් සම්මතකොට ක්‍රියාත්මක කරනු ලැබූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවයි.මෙම ව්‍යවස්ථාව පිළිබඳව අධ්‍යයනය කරන විට එම ව්‍යවස්ථාව සම්පාදනය කළ පසුබිම ,එම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ හා එම ව්‍යවස්ථාවේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කළ යුතුය.

1972 දී ලංකාවට නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතුයැයි මෙරට විවිධ දේශපාලන අංශ විසින් පෙන්වා දෙනු ලැබීය.ඒ අනුව නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳ අදහස පළමු වරට පැමිණෙන්නේ 1948 සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවට හඳුන්වාදීමත් සමඟිනි.සෝල්බරි ව්‍යවස්ථාවේ විවිධ දුර්වලතාවයන් සහ ඊට පරිබාහිර අවශ්‍යතාවයන් හේතු කොටගෙන නව ව්‍යවස්ථාවක අවශ්‍යතාවය ඇති විය.ඒ අනුව 1956 දී බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණු රජයේ අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතාගේ පළමු රාජාසන කතාව මඟින් ලංකාව සඳහා නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතුයැයි ප්‍රකාශ කළේය.තවද,1957 නොවැම්බර් මාසයේදී ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදි.කමිටුවේ කාර්යභාරය වූයේ,නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධ නිර්දේශ සළකා බැලීමයි.එහෙත් 1959 බණ්ඩාරනායක මහතාගේ ඝාතනය සමඟ එය අතරමඟ නතර වූණි.නැවත 1965 ඩඩ්ලිසේනානායක ආණ්ඩුව ද නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතු යැයි ප්‍රකාශ කළ එය යථාර්ථයක් නොවීය.නව ව්‍යවස්ථාවක් පිළිබඳ මීළඟ උත්සාහය වූයේ 1970 මහා මැතිවරණ කාලයයි.1970 මහා මැතිවරණය සඳහා තරඟ කළ ශ්‍රී.ල.නි.පක්ෂය ප්‍රධාන සමඟි පෙරමුණ මැතිවරණ වේදිකාවේ සිටම ප්‍රකාශ කළ ප්‍රබල අදහසක් වූයේ තමන්ට 2/3 ක බලය ලබා දෙන ලෙසත් ,තමන් බලයට පත්වුවහොත් ශ්‍රී ලංකාව සඳහා නව දේශජ ව්‍යවස්ථාවක් සම්පාදනය කරන බවය.නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ලංකාවට අවශ්‍යය යන්න මෙරට දේශපාලන අංශ දැඩිව අවධාරණයට ලක්වූයේ 1948 සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු පහත සඳහන් දූර්වලතා හේතුවෙනි.

### 01.සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මඟින් ලාංකිකයන්ට ලබා දුන් නිදහස පරිපූර්ණ එකක් නොවෙනවාය යන තර්කය

එනම්,ලංකාවට බ්‍රිතාන්‍යයන් නිදහස ප්‍රදානය කරන ලබා දුන් සමහර විධිවිධානයි.ඒ අතර ,

i. 1947 ලංකා නිදහස් පනතේ 1 වන වගන්තියට අනුව ලංකාව ඉල්ලා සිටියහොත් හෝ ලංකාව අනුකූලතාව දැක්වුවහොත් ලංකාව සඳහා පනත් සම්මත කිරීමේ බලය බ්‍රිතාන්‍යයන් සතු වීම:

ii. 1946 ලංකාණ්ඩුක්‍රම රාජාඥාවේ 39 ඡේදයේ ප්‍රකාශ වන ආකාරයට ලංකා පාර්ලිමේන්තුව පනවා අවසාන අනුමැතිය සඳහා අග්‍රාණ්ඩුකාරවරයාට යවන සමහර පනත් අවලංගු කිරීමට හැකි අතර ,නැතිනම්,මහරජුගේ නියෝජිතයා වශයෙන් අග්‍රාණ්ඩුකාරවරයාට බ්‍රිතාන්‍ය මහරජුගේ අනුමැතිය ලබා ගන්නා ලෙස නියම කළ හැකි වීම.

iii. 1946 ලංකාණ්ඩුක්‍රම රාජාඥාවේ 4වන ඡේදයේ ප්‍රකාරව ,II වන උප වගන්තියට අනුව බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රම සම්ප්‍රදායන් ලංකාණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේ දී අනුගමනය කළ යුතු යැයි ප්‍රකාශ වීම.

iv. 1946 රාජාණ්ඩු ක්‍රම පනතේ 4 පරිච්ඡේදයේ 5වන උපවගන්තියට අනුව "දිවයිනේ විධායක බලය හා. කටයුතු තවදුරටත් අයත්වන්නේ බ්‍රිතාන්‍ය කිරීටයටයි,,. බ්‍රිතාන්‍ය වෙනුවෙන් එම බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ කිරීටයේ නියෝජිතයා වන අග්‍රාණ්ඩුකාරවරයාය.

v. 1946 රාජාණ්ඩු ක්‍රම පනතේ 4.1 වගන්තියට අනුව අග්‍රාණ්ඩුකාරවරයා පත්කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය කිරීටය මඟින් වන අතර ,ඔහුට තනතුරේ කටයුතු කළ හැකි වන්නේ බ්‍රිතාන්‍ය කිරීටයේ කැමැත්ත ඇතිතාක් පමණි යන්න සඳහන් විය.

vi. සෝල්බරි ව්‍යවස්ථාවේ 7 වන ඡේදයේ ප්‍රකාරව ,දිවයිනේ ආණ්ඩු ක්‍රමය මෙහෙයවන පාර්ලිමේන්තුව සමන්විත වන්නේ බ්‍රිතාන්‍ය මහරැජිණ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ,උත්තර මන්ත්‍රී මණ්ඩලය යන ආයතන තුනට සමානවන ආකාරයටයි.

vii. සෝල්බරි ව්‍යවස්ථාවේ 25 වන වගන්තිය මඟින් ප්‍රකාශ වන ආකාරයට උත්තර මන්ත්‍රී මණ්ඩල ,නියෝජිත මන්ත්‍රී මණ්ඩල් දෙකේම සෑම මන්ත්‍රීවරයෙකුම සිය තනතුරේ වැඩ ආරම්භ කිරීමේදී දිවුරුම් දිය යුතු වූයේ බ්‍රිතාන්‍ය මහරජුට හෝ රැජිණට පක්ෂපාතී වන බවට හෝ අවනත වන බවටයි.

viii. සෝල්බරි ව්‍යවස්ථාවේ 57 වගන්තිය මඟින් ප්‍රකාශ වූ ආකාරයට දිවයිනේ සෑම රාජ්‍ය සේවකයෙකුම සිය තනතුරේ වැඩ කටයුතු ආරම්භ කරන්නේ බ්‍රිතාන්‍ය මහරැජිණගේ කැමැත්ත ඇතිතාක් පමණි.

ඉහත සඳහන් සෑම වගන්තියකම විධිවිධාන පරීක්ෂා කිරීමේදී පෙනියන්නේ නිදහස් ජාතියකට අවශ්‍ය දේශපාලන පදනමක් ලංකාවේ නොවූබවය. මේ නිසා නව නිදහස් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදන කළ යුතුය යන අදහස ප්‍රකාශ විය.

**02.1948 සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවූ පාර්ලිමේන්තුව සර්වාධිපති ආයතනයක් නොවිය.විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 වගන්තියට ඇතුළත් වූ විධිවිධාන**

**03.මූලික මිනිස් අයිතිවාසිකම් පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොවීම**

**04.1948 සෝල්බරි ව්‍යවස්ථාව දේශීය ජනතාවගේ සහභාගීත්වයෙන් සම්පාදනය නොවීමත් ,දේශීය ජනතාවගේ සිතුම් පැතුම් ,අවශ්‍යතා ,අභිලාශයන් නිරූපණය නොවෙනවාය යන අදහස**

**05 .1948 සෝල්බරි ව්‍යවස්ථාව මඟින් ගොඩනැගූ ආණ්ඩු ක්‍රම ආයතනික රටාව තුන්වන ලෝකයේ සංවර්ධන වෙමින් පවතින රටකට නොගැළපෙනවාය යන අදහස .එනම්,සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ ආයතනික රටාව සුපිරි පන්තියේ කැබිනට් ආණ්ඩු ක්‍රම ආයතනික රටාවක් බවත් ,එවැනි සුපිරි කැබිනට් ආණ්ඩු**

ක්‍රම ආයතනික රටාවක් ලංකාව වැනි නොදියුණු දේශපාලන සංස්කෘතියක ක්‍රියාත්මක කළ නොහැකිය යන අදහස

**06.ශ්‍රී ලංකාව හා බ්‍රිතාන්‍ය අතර එවකට අත්සන් කොට තිබූ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍ය උල්ලංඝනය වී ඇතැයි ප්‍රකාශ වීම.**

1970 මැතිවරණයේදී සමගි පෙරමුණ අපේක්ෂා කළ පරිදි 2/3 ක පාර්ලිමේන්තු බලයක් ලැබුණි.අනතුරුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවිය.මෙම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසින් සම්පාදනය කළ ව්‍යවස්ථාව 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවයි.එමගින් පහත සඳහන් ආකාරයේ ආයතනික රටාවක් ගොඩනගනු ලැබිය.

1.ජනාධිපතිවරයා (නාමික විධායකය)

2.අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය

3.ඒක මණ්ඩලීය ව්‍යවස්ථාදායක සභාව (ජාතික රාජ්‍ය සභාව )

4.ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා අධිකරණය

5.රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්මය

6.මූලික අයිතිවාසිකම් හා නන්වැදැරුම් නිදහස

7.රාජ්‍ය සේවය

8.නියෝජන ක්‍රමය

9.අධිකරණ සේවා උපදේශක/විනය මණ්ඩලය සහ රාජ්‍ය සේවා උපදේශක /විනය මණ්ඩලය

**1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස් වන ආකාරය ( මූලික වෙනස්කම්)**

1. **ජනතා පරමාධිපත්‍ය :**

1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3,4,5 වගන්ති මගින් තහවුරු කොට ඇත. 3 වන වගන්තිය මගින් ප්‍රකාශ වන ආකාරයට ජනතාව .කෙරේ පිහිටා ඇත.4 වන වගන්තියට අනුව එය ක්‍රියාත්මක කරන්නේ ජනතාව විසින් තෝරා පත් කළ ජාතික රාජ්‍ය සභාව මගිනි.5 වන වගන්තියට අනුව ජනතා පරමාධිපත්‍ය බලය ජනතාව විසින් තෝරා පත් කළ ව්‍යවස්ථාදායකය,විධායකය හා අධිකරණය මගින් ක්‍රියාත්මක වේ.

**2.ඒක මාණ්ඩලික ස්වභාවය :**

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විය.නමුත් 1972 ව්‍යවස්ථාව මගින් සෙනෙට් මණ්ඩලය අහෝසි කරන ලදි.

**3.රාජ්‍ය සේවය :**

දේශපාලන විධායකයේ නායකත්වයට පත් කරන ලදි.1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කරන ලදි.

**4.අධිකරණ ක්‍රමය :**

අධිකරණ ක්‍රමය සංශෝධනය කළ අතර ,1972 ව්‍යවස්ථාවේ 54 ,65 වගන්ති වලට අනුව අධිකරණ ව්‍යුහය සංශෝධනය කළ අතර ,ව්‍යවස්ථා අධිකරණය පිහිටුවීම කැපී පෙනේ.

**5. මූලික අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස :**

මූලික අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය පොදු තත්ත්වයට ගලපන ලදි.1948 ව්‍යවස්ථාවේ පැවැති සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විශේෂ විධිවිධාන අහෝසි කරන ලදි.1972 ව්‍යවස්ථාවේ 18 වගන්තිය මඟින් තහවුරු කොට ඇත.

**6.රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්මය :**

විශේෂයෙන් 1972 ව්‍යවස්ථාවේ 5 වන පරිච්ඡේදයේ 16,17 වගන්ති මින් තහවුරු කොට ඇත.

**7.ජනාධිපතිධුරය :**

මෙතෙක් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමයේ නොතිබුණු ආකාරයේ නාමික විධායක ජනාධිපති ක්‍රමයක් පිහිටුවිය.

**8.රාජ්‍ය සේවා /අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල පිහිටුවීම**

**9.බුද්ධාගම හා සිංහල භාෂාවට ප්‍රමුඛත්වය පිරිනැමීම :**

1972 ව්‍යවස්ථාවේ 7 ,8,9, වගන්ති මඟින් තහවුරු කොට ඇත.

**10. අනම්‍යභාවය :**

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වේ. ව්‍යවස්ථාව වෙනස් කිරීමට ජාතික රාජ්‍ය සභාවේ 2/3 ක බහුතරයකින් සම්මත කළ යුතුය.1972 ව්‍යවස්ථාවේ 51 වගන්තියේ 5 වන උප වගන්තිය මඟින් එය දැක්වෙයි.

**11.ඒකීය රාජ්‍යයක් වශයෙන් සඳහන් වීම** : 1972 ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය මඟින් ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් වශයෙන් දැක්වෙයි.

## 1972 ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති සුළුජන අයිතිවාසිකම් සඳහා වූ විධිවිධාන

1.මූලික මිනිස් අයිතිවාසිකම් වගන්ති මඟින් තහවුරු කොට සුළු ජනතාවට සමාන පිළිගැනීමක් ඇති කිරීම.

2.බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය :

## 1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට එල්ල වූ චෝදනා

1.සිංහල බෞද්ධ බහුතරයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවකි යන්න,

2.බ්‍රිතාන්‍ය කැබිනට් ආණ්ඩු ක්‍රමයට ස්ථාපිත කිරීම.

3.පාර්ලිමේන්තු ස්වාධීනත්වය තහවුරු කළා යැයි ප්‍රකාශ කළ ද හදිසි අවස්ථාවකදී 45 වගන්තියේ 4 වන ඡේදයට අනුව රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ බලය ජනාධිපතිවරයාට පවරාදේ.

4.බලතල අවශ්‍ය තරමට වඩා ජාතික රාජ්‍ය සභාවට ඒකරාශී කිරීම .ව්‍යවස්ථාදායක ,විධායක ,අධිකරණ ත්‍රිවිධ බලයම ඒකරාශී කොට ඇත.

5.පක්ෂ ක්‍රමය තුළ බිහිවන අගමැතිවරයාට අතිවිශේෂ බලය ප්‍රායෝගිකව හිමිවීම.

6.මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන විශේෂයෙන් මූලික අයිතිවාසිකම් කඩවුණු අවස්ථාවකදී නීතියේ පිහිට පැතීමට නොහැකි වීම.

## 02. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ව අධ්‍යයනය කරන විට,පහත ශීර්ෂ යටතේ සාකච්ඡා කෙරේ.

1. පසුබිම
2. ආයතනික විධිවිධාන
3. 1978 ව්‍යවස්ථාවට එල්ල වූ විවේචන

1978 අගෝස්තු 31 වන දින සිට දෙවන ජනරජ ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරනු ලැබීය.මෙමගින් පූරා වසර 30ක් තිස්සේ ක්‍රියාත්මක වූ කැබිනට් සම්ප්‍රදායේ ආණ්ඩු ක්‍රමය ප්‍රතික්ෂේප කොට ජනාධිපති විධායක ආණ්ඩු ක්‍රමයක් පිහිටුවනු ලැබීය.

1978 නව ආණ්ඩු ක්‍රමයක් ආදේශ කිරීමට බලපෑ කරුණු කිහිපයකි.

i. 1947 -1972 කැබිනට් ආණ්ඩු ක්‍රමය මෙරට අවශ්‍යතාවයන්ට නොගැලපෙන ආකාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයක්ය යන්න.

ii. අස්ථාවර ආණ්ඩු ක්‍රමයක් ලෙස කැබිනට් ආණ්ඩු ක්‍රමය පිළිගැනීම

එනම්,කැබිනට් ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණය වන්නේ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පවතින අතිශය සමීප සබඳතාවයයි.කැබිනට් ආණ්ඩු ක්‍රමය විධායකය වන අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයෙන් තේරී පත්වන අතර විධායකයට කටයුතු කළ හැක්කේ ව්‍යවස්ථාදායකයේ සහාය තිබෙනතාක් පමණි

iii. ශක්ක හදිසි තීරණ ගැනීමේ හැකියාව නොමැති වීම

iv. 1972 රාජ්‍ය නායකයා හා ඔහුගේ තත්ත්වය

ඉහත සඳහන් කළ ආකාරයට කැබිනට් ආණ්ඩු ක්‍රමය වර්ෂ 30 ක් පමණ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කොට එහි දුර්වලතා හඳුනාගෙන තිබුණි.1978 නව ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් සම්පාදනය කිරීමට අවධානය යොමු විය.

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් පහත සඳහන් ආකාරයේ ආයතනික රටාවක් ගොඩනඟනු ලැබීය.

i. ජනාධිපතිවරයා
ii. පාර්ලිමේන්තුව
iii. අධිකරණ ක්‍රමය
iv. නියෝජන ක්‍රමය
v. පළාත් සභා හා පළාත් පාලන ක්‍රමය
vi. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ විධිවිධාන

## 03.ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය

i. සම්භවය
ii. සංවිධාන ව්‍යුහය
iii. පසුකාලීන දේශපාලනයට කළ බලපෑම
iv. දුර්වලතා

## 04.ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය

i. පක්ෂ වල උපත
ii. සංවිධාන ව්‍යුහය
iii. ප්‍රතිපත්තීන්
iv. නව ප්‍රවණතාවයන්

## 05.ශ්‍රී ලංකාවේ ආගම හා දේශපාලනය

ශ්‍රී ලංකාවේ ආගම හා දේශපාලනය පිළිබඳ විශ්ලේෂණයේදී ප්‍රධාන මාතෘකාවක් වන්නේ දේශපාලනය හා ආගම අතර පවතින දැඩි සම්බන්ධතාවයයි.එය පහත සඳහන් ශීර්ෂ යටතේ සාකච්ඡා කළ හැක.

i. නිදහසට-පෙර යුගයේ ආගම හා දේශාලනය අතර පැවති සම්බන්ධතාව
විශේෂයෙන්ම ජාතික ව්‍යාපාරය වැනි දේශපාලන ව්‍යාපාර වල ආගමික නැඹුරුව
ii. දේශපාලන පක්ෂ ක්‍රමය තුළ ආගමික සාධකයේ වැදගත්කම
iii. රාජ්‍ය ප්‍රතිපත්තිය හා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන් තුළ ආගමික සාධකයේ වැදගත්කම
iv. මැතිවරණ ප්‍රචාරක ක්‍රමය තුළ ආගමික සාධකයේ වැදගත්කම
v. දේශපාලන අරගලවල ආගමික සාධකයේ වැදගත්කම
vi. ජාතික සංකේත වල ආගමික සාධකය

## 06. ශ්‍රී ලංකාවේ විමධ්‍යගත පරිපාලනය

i. පළාත් සභා ක්‍රමය
ii. පළාත් පාලන ආයතන